| මතුගම අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන | | |
| 7 ශ්‍රේණිය | වායුගෝලය | ඒකකය - 13 |

# A කොටස

වරහන් තුළින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(මධ්‍ය ගෝලය, උන්නතාංශය, උෂ්නත්වය, පීඩනය,වායුගෝලය, වායු පීඩනය, තාප ගෝලය, වායු දූෂණය, පරිවර්තී ගෝලය, නයිට්‍රජන්)

01. පෘථිවිය වටා ගෝලාකාරව විහිදී පවතින වායු වැස්ම ........................................................... යි.
02. වාතයේ බර නිසා ඇති වන පීඩනය .................................................................................. යි.
03. කිසියම් ස්ථානයකට මුහුදු මට්ටමේ සිට පවතින උස ....................................................... ලෙස හඳුන්වයි.
04. උන්නතාංශය අනුව වායු ගෝලය තුළ වෙනස් වන සාධක දෙක වන්නේ .................................... හා ..................................................... යි.
05. වායු ගෝලීය ස්තරවලින් සිසිල්ම ස්තරය වන්නේ ................................................................ යි.
06. ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය රඳවා ඇත්තේ ........................................................... ට අයත් පෙදෙසෙහිය.
07. පෘථිවි ජීවීන්ට වඩාත් වැදගත් වන වායු ගෝලීය ස්ථරය වන්නේ ............................................. යි.
08. වායුගෝලයේ වැඩිම ප්‍රතිශතයක් අඩංගු වායුව වන්නේ ................................................. වායුවයි.
09. වායු ගෝලීය සංයුතිය ජීවීන්ට අහිතකර ලෙස වෙනස් වීම ................................................... ලෙස හඳුන්වයි.

(ලකුණු 01×10 = 10)

The National e-learning Portal for The General Education

# B කොටස - රචනා

01.




i. A – E දක්වා කොටස් නම් කරන්න. (ල. 1×5)

ii. වායුගෝලයට අයත් මුළු වායු ප්‍රමාණයෙන් 25% ක් පමණ ඇත්තේ ............................. තුලයි.(ල. 01)

iii. ස්තර ගෝලය තුළ පිහිටා ඇති සුවිශේෂ ස්තරය නම් කරන්න. (ල. 01)

iv. එම ස්තරය මගින් ඉටු කෙරෙන ප්‍රධාන කාර්යය නම් කරන්න. (ල. 02)

02. පහත දී ඇති වායු දූෂක නිවැරදි කවය වෙත යා කරන්න

i.




නොදැවුණු ඉන්ධන බිඳිති
සල්ෆර්ඩයොක්සයිඩ්
කාබන් අංශු
ඊයම් අංශු
කෘමි නාශක බිඳිති
සිමෙන්ති කුඩු
කාබන්මොනොක්සයිඩ්
ඇස්බැස්ටෝස් අංශු
නයිට්‍රජන්ඩයොක්සයිඩ්
දූවිලි අංශු




(ල. 1/2×10)

ii. වායුගෝලය මගින් ඉටුවන කාර්යයන් 4 ක් ලියන්න.

iii. වායුගෝලය දූෂණයෙන් ඇති විය හැකි ප්‍රතිඵල තුනක් ලියන්න. (ල. 03)

01. වාතයේ සංයුතිය දැක්වෙන වට ප්‍රස්තාරය පහත දැක්වේ. ½ x10




i. A හා B වායු සංඝටක නම් කරන්න. (ල. 02)

ii. B වායුමය සංඝටකය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා දෙකක් නම් කරන්න. (ල. 02)

iii. A වායුගෝලයට එකතු වන ශාක තුළ සිදු වන ප්‍රධානතම ජෛව ක්‍රියාවලිය කුමක්ද? (ල. 01)

iv. වායු දූෂණය අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල. 03)

v. දූෂිත වායු ආශ්වාස කිරීමෙන් ඇති විය හැකි රෝගාබාධ දෙකක් ලියන්න. (ල. 02)

02. පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණද වැරදි නම් (X) ලකුණද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

i. පරිවර්ති ගෝලයේ ඉහළට යන විට උෂ්ණත්වය අඩු වේ. (...............)

ii. උන්නතාංශය වැඩි වන විට පීඩනය වැඩි වේ. (...............)

iii. දූෂිත වායු ගෝලයක් ඇති ඇතැම් රටවල ශ්වසනය පහසු කිරීමට කෘත්‍රිම ශ්වසන කුටීර සාදා ඇත (...............)

iv. නැවත වන වගා ඇති කිරීම වායු දූෂණය අවම කිරීමට ගත හැකි සාර්ථක ක්‍රියාමාර්ගයක් නොවේ (...............)

v. නයිට්‍රජන් පසට එකතු වන ප්‍රධානතම ප්‍රභවය වන්නේ වායුගෝලයයි. (...............)

vi. ශාක වල ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලියට ඔක්සිජන් වායුව අවශ්‍ය වේ. (...............)

vii. ජීවීන්ගේ පැවැත්ම සඳහා ජල චක්‍රය අත්‍යවශ්‍ය වේ. (...............)

viii. කැටි වැහි වලාකුළු ඇති විට අකුණු ගෙරවිලි සහිත වැසි අපේක්ෂා කළ හැකිය. (...............)

ix. හෙලිකොප්ටර්, පැරෂුට්, සාමාන්‍ය ගුවන් ගමන් ආදිය සිදු වන්නේ ස්ථර ගෝලයේය. (...............)

x. උත්තරාලෝකය හා දක්ෂිණාලෝකය යන දර්ශන දිස් වන්නේ තාප ගෝලය තුළයි. (...............)

(ල. 10)

The National e-learning Portal for The General Education